# කතෘගෙන්

රටේ ජනගහනය ගුනෝත්තර ශ්‍රේඨියකින් වැඩි වන අතර කෘෂිකාර්මික නිෂ්පාදනය සමාන්තර ශ්‍රේඨියකින් වැඩි වන මේ යුගයේ අප රටේ ගම්බද ගොවිතැන කාර්මික ව්‍යාපාරයක් බවට පරිවර්තනය වීමෙන් සම්භාර නිෂ්පාදන යට රැකුලක් ඇති වනවා පමණක් නොව නිෂ්පාදන ඒකකයක් වඩා අඩු මිලකට නිපදවීමෙන් ආනයනය කෙරෙන නිෂ්පාදිතයන් සමඟ දේශීය ගොවි භාණ්ඩ වලට සාර්ථක ලෙස තරඟ කිරීමටද පුළුවන් වෙයි.

මේ නයින් බලන කල කවුරු කෙසේ කීවත් මෙද හාපුරා කියා පොලොන්නරුවේ විවෘත වූ රස ගැන් වූ උකුකිරි කම්හල රටටත්, ජාතියටත් ආඩම්බර විය හැකි කර්තව්‍යයකි. අප ක්‍රම ක්‍රමයෙන් දියුණුව කරා පා නගනවා මිස හදිසිය ඇති වූ පමණට රටේ අවශ්‍යත වයන් ඇති වූ පමණට, ඇස්ව සිල්ලකින්, නිමේෂයකින්, ක්ෂණයකින්, දුරදිග නොබලා, රොකට් වෙඩිල්ලක් ගුවන සිසාරා යන ලෙස මෙවැනි ව්‍යාපාර ඇරඹිය නොහැක. මෙවැනි ව්‍යාපාර ඇරඹීමට විද්‍යාඥයින්ගේ, විශේෂඥයින්ගේද රජයේ සේවකයින්ගේද මහජන යාගේද, සැලසුම් කරුවන්ගේද, කාර්මික ආධාර දෙන්නන්ගේද, නොමසුරු නොපසුබට බලවත් සහයෝගය අවශ්‍යමැයි. ඔක්ස්ෆඩ් ඉංග්‍රීසි විශ්වකෝෂය සම්පාදනය කිරීමට ලෝකයේ බලවත් ජාතියක් වූ ඉංග්‍රීසි ජාතිකයින්ට පුරා අවුරුදු 700 ක් ගතවූයේ නම් ආර්ථික පරිහානියෙන් පෙලෙන මේ පුංචි ලංකාවේ ගොවිතැන කාර්මික ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමට අප කොපමණ උනන්දුවක්, පරිශ්‍රමයක්, උත්සාහයක්, කාලයක්, මුදලක් වැය කළ යුතු වේ දැයි උගත් පාඨක ජනතාව තම මනැස යොමු කොට බලත්වා.

මේ උකුකිරි කම්හල තවම බොලඳ අවස්ථාවේය. තම කුඩා දරුවාට තම මව කිරි දී පෝෂණය කරන්නේ යම්සේද එසේම ලංකාවාසී අප සැවොම එක්ව මෙම කම්හල නොව ලංකාවේ මතු ඇති වන හෝ දැනට ඇති අනිකුත් ව්‍යාපාරද කඩාකප්පල් වීමට ඉඩ නොදී රටේත් ජාතියේත් නාමයෙන් ආරක්ෂා කළ යුතුය. දියුණු කළ යුතුය. සංවර්ධනය කළ යුතුය. එවැනි කර්තව්‍යයන්ට සහයෝගය ලබා දිය යුතුය. නැගී එන ළපිටි ගසක කරටිය කඩා දමන සේ අනවශ්‍ය විවේචන නොකළ යුතුය. අනවශ්‍ය විවේචන වලින් දක්ෂ වැඩකරු වන්ගේ සිත් කලකිරීමට පත් වේ.

පොලොන්නරුවේ රස ගැන්වූ උකුකිරි කම්හල මෙරට විදේශ විනිමය දෙකෝටි තිස් ලක්ෂයක මුදලක් රකී. අවුරුද්දකට උකුකිරි ටින් කෝටි $2\frac{1}{2}$ ක් නිපදවීමට සැලසුම් කර ඇති තමන්කඩුවේ මෙම උකුකිරි කම්හල නවසීලන්ත යෙන් තෑගි දුන් රන්පවුම් ලක්ෂයක් හා මෙරට මුදලින් රු. 50 ලක්ෂ පණස් දහසක මූලධන වියදමකින් ඉදිකෙරිණි.

මෙම කම්හලේ තෙවැනි පියවර අවසන් වූ පසු රටට අවශ්‍ය බටර් රාත්තල් 27,40,740 ක් ද නිෂ්පාදනය වේ.

මෙම කිරි කම්හලට දිනකට අවශ්‍ය කිරි ප්‍රමාණය කිරි පයින්ට් 1,20,000 ක් වන අතර දැන් කිරි මණ්ඩලය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තමන්කඩුවේ කිරිපට්ටි ව්‍යාපාරය තව තවත් දියුණු කිරීමට ලහි ලහියේ වැඩ කරගෙන යති. කාලයාගේ ඇවෑමෙන් අවශ්‍ය සම්පූර්ණ කිරි ප්‍රමාණයම මෙරට දෙනුන්ගෙන් ලැබී කම්හලේ තෙවැනි පියවර නිම වූ පසු රසගැන්වූ උකුකිරි මෙන්ම බටර්ද තරඟකාරී අඩු මිලකට මහජනයාට ලැබෙනවා ඇත.

රටේත් ජාතියේත් පිනින් බිහි වූ මෙම කම්හල තවත් දියුණු වේවායි අප ප්‍රාර්ථනා කළ යුතු වන අතර, තවත් මෙවැනි කම්හල් මෙරට තුළ ඉදිවී බිහිවී මෙරට කිරියෙන් පැණියෙන් ස්වයංපෝෂිත වේවායි ආශිංශනය කරමු.

මහජනයාට මෙම කිරි කම්හලට දියහැකි උසස්ම සහයෝගය නම් හැකිතරම් කිරි පුද්ගලික ගොවිපලවල නිපදවා කිරි මණ්ඩලයේ එකතුකිරීමේ මධ්‍යස්ථාන වලට සැපයීමයි. දියුණු රටවල මහජනයා තුල නිරායාසයෙන්ම කිරි බීමේ පුරුද්දක් තිබේ. අප රටේ දිනකට එක් අයෙක් කිරි අවුන්ස් දෙකක් පාවිච්චි කරන අතර දියුණු රටවල එක් අයෙක් කිරි අවුන්ස් 20 ක් දිනපතා පරිභෝග කරයි. මන්ද පෝෂණයෙන් පෙළෙන අපරට වැසියන් අතුරෙන් රට දියුණු කිරීමට අවශ්‍ය විද්‍යාඥයින් ගණිතඥයින් ආදිය බිහිකල හැක්කේ වඩා වඩා උසස් කිරි ආහාර ආදිය අපේ ලදරුවන්ට දී කිරි බීමේ පුරුද්දක් අප ජාතියේ ඇතිකිරීමෙනි. බොහෝ මැණිවරුන්ද මන්දපෝෂණයෙන් පෙළෙන බැවින් දරුවන්ට පිටරටින් ගෙනෙන කිරිපිටිම දී සැනසෙති. එබැවින් "අම්මා පෙවූ රන්කිරිවල බලමහිමය" මෙයයි මතුපරපුරට රටට හඬගා කීමට හැකිවනසේ අපි දැන් දැන්ම වැඩි වැඩියෙන් කිරි නිපදවා රට සරු කරමු.

**සෑම පෙර පෝය දිනකම පස්වරු 6.30 ට සවදේශීය සේවාව ඔස්සේ විසුරුවා හරින කෘෂිකර්ම පැන පිළිතුරු තරඟයට සවන් දෙන්න.**

**එය මුළු පවුලටම රස විඳිය හැකි වැඩ සටහනකි.**